// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2258/15 - 2021 දෙසැම්බර් මස 14 වැනි අඟහරුවාදා - 2021.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 2/1976 (iv)

**1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත**

1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියෝග.

**ජයම්පති මොල්ලිගොඩ,**
සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

2021 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2010 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1677/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2010 අංක 01 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ ප්‍රවර්ධන සහ අලෙවි ක්‍රමෝපාය සඳහා බදු එකතු කිරීම) නියෝග, ඒ යටතේ කරනු ලැබූ කිසිවකට අගති රහිතව මෙය *ගැසට් පත්‍රයේ* පළ කල දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 12 - 0136/1

1A - PG 5660 — 435 (2021/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එල්.ඩී.බී. 2/1976 (iv)

**1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත**

13(1)(ආ) වන වගන්තිය යටතේ වන නියමය

1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13(1)(ආ) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වැවිලි අමාත්‍ය රමේෂ් පතිරණ වන මම, මෙම නියමය මගින්, එම පනතේ 13(1)(අ) වගන්තිය යටතේ 2006 අප්‍රේල් මස 17 වැනි දින අංක 1441/03 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් නියම කර ඇති සෙස් බද්ද සෑම කිලෝග්‍රෑම් එක් සියයක් සඳහා රුපියල් හාර සියයක් බැගින්" වෙනුවට "සෑම කිලෝග්‍රෑම් එක් සියයක් සඳහා රුපියල් තුන් සියයක් බැගින්" විය යුතු ලෙස වෙනස් කරමි.

**රමේෂ් පතිරණ,**
වැවිලි අමාත්‍ය.

2021 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0136/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.